ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

| 60 | S | I, II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2022(2023 මාර්තු)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022 (2023 மார்ச்)
Genaral Certificate of Education (Ord. Level) Examination, 2022 (March 2023)

| ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II<br>வணிகக் கல்வியும் கணக்கீடும் I, II<br>**Business and Accounting Studies I, II** | පැය තුනයි<br>*Three hours* | 10 ශ්‍රේණිය<br>*Grade 10* |
|---|---|---|

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

සැලකිය යුතුය :
- (i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- (ii) 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- (iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය මත (x) ලකුණ යොදන්න.

පහත සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්ණ අංක 01 සිට 03 තෙක් ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.

පරිසර අලංකරණයට ඉතාමත් කැමැත්තක් දක්වන කාවින්දි ප්‍රදේශයෙන් සපයාගත් විවිධ පැළ වර්ග දර්ශනීය ආකාරයට සකස් කරමින් "සෞභාග්‍යා විසිතුරු පැළ" නමින් වෙළෙඳ සැලක් ආරම්භ කරන ලදි. ප්‍රධාන මාර්ගය යාබද වීම නිසා විවිධ ගනුදෙනුකරුවන්ගෙන් මල්පැලල හා තණකොළ වර්ග සඳහා ඉහල ඉල්ලුමක් ඇත.

01. කාවින්දිගේ ව්‍යාපාරය මගින් සපයන ලබන මූලික මිනිස් අවශ්‍යතාවය කුමක් ද?
(i) ආහාර (ii) නිවාස (iii) විනෝදය (iv) සෞඛ්‍යය

02. ඉහත සිද්ධියේ සඳහන් මෙම ව්‍යාපාරයට බලපෑ හැකි තර්ජනයක් නොවනුයේ,
(i) සේවකයන් මල් පැල සොර ගැනීම.
(ii) අධික වැසි ලැබීම.
(iii) නව මල්පැල අළෙවි වෙළෙඳසැලක් ආසන්නයේ ඇරඹීම.
(iv) කෘත්‍රිම මල් මිලට ගැනීමට ප්‍රජාව නැඹුරු විම.

03. නිෂ්පාදන සාධක අතුරින් මල්පැල අයත් වනුයේ,
(i) භූමිය (ii) ශ්‍රමය (iii) ප්‍රාග්ධනය (iv) ව්‍යවසාය

04. ව්‍යාපාර සඳහා බදු සහන දිරි ගැන්වීම් ලබා දීම, ව්‍යාපාරයකට,
(i) ශක්තියකි (ii) දුර්වලතාවයකි (iii) අවස්ථාවකි (iv) තර්ජනයකි

05. ව්‍යාපාර කටයුතු කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවයන්හි දායකත්වය සඳහා නිදසුන් කිහිපයක් පහත දැක්වේ.
A - ව්‍යාපාර කටයුතු සුපරීක්ෂණය
B - ව්‍යාපාර සඳහා හිතකර විවිධ දිරි ගැන්වීම් ලබා දීම.
C - පවරන ලද කාර්ය නිසි පරිදි ඉටු කිරීම.

ඉහත A, B හා C යන්න දායකත්වය සඳහා නිදසුන් ඉටුකර ගැනීමට උනන්දුවක් දක්වන පාර්ශව පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(i) අයිතිකරු, කළමණාකරු, සේවකයන් (ii) කළමණාකරුවන්, රජය, සේවකයන්
(iii) කළමණාකරුවන්, අයිතිකරුවෝ, රජය (iv) අයිතිකරුවෝ, රජය, කළමණාකරුවෝ

06. ව්‍යාපාරයක ඇල්මැති පාර්ශවයන් A තීරුවේ ද ඔවුන් ව්‍යාපාර කෙරෙහි ඇල්මක් දැක්වීමේ අරමුණු B තිරුවේ ද දැක්වේ.

| A | B |
|---|---|
| 1. අයිතිකරු | P සාධාරණ මිලක් තිබේ ද? |
| 2. කළමණාකරුවන් | Q කීර්තිනාමයක් ලබා තිබේ ද? |
| 3. සේවකයින් | R කළමණාකරුවන්ගේ තීරණ සාර්ථක ද ? |
| 4. ගනුදෙනුකරුවන් | S රැකියාව සුරක්ෂිත ද? |

(i) P, Q, R, S (ii) Q, R, S, P (iii) R, S, P, Q (iv) S, P, Q, R

07. ව්‍යාපාරිකයින්ට සිය අභිමතය පරිදි ව්‍යාපාර කටයුතු කිරීමේ හැකියාව සීමා කිරීම තුලින් පාරිභෝගිකයා හා දේශීය නිෂ්පාදකයන් ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාත්මක වන ව්‍යාපාර පරිසරය වනුයේ,

(i) දේශපාලන පරිසරය (ii) ආර්ථික පරිසරය
(iii) ගෝලීය පරිසරය (iv) නෛතික පරිසරය

08. ශ්‍රී ලංකා රුපියලේ අගයට සාපේක්ෂව ඇමරිකානු ඩොලරයේ අගය ඉහල යාම ඇගලුම් අපනයනය කරන සමාගමකට,

(i) අභ්‍යන්තර පරිසර සාධකයකි (ii) ආර්ථික පරිසර සාධකයකි.
(iii) නෛතික පරිසර සාධකයකි (iv) තාක්ෂණික පරිසර සාධකයකි.

09. ව්‍යාපාරිකයන් නිපදවන භාණ්ඩ හා සේවා ප්‍රමාණය, මූල්‍ය ශක්තිය, නිෂ්පාදනයට අදාල වෙළෙඳ පොල කොටස, කුසලතා හා පළපුරුද්ද යන සාධක අදාල වන්නේ,

(i) ස්වභාවය අනුව ව්‍යාපාර වර්ග කිරීමේ දී (ii) අරමුණ අනුව වර්ග කිරීමේ දී
(iii) හිමිකාරත්වය මත ව්‍යාපාර වර්ග කිරීමේ දී (iv) පරිමාණය අනුව ව්‍යාපාර වර්ග කිරීමේ දී

10. අෂාන් ඉමල්ෂ තමා ආරම්භ කිරීමට අපේක්ෂිත ව්‍යාපාරය "ෂාන් පොත් වෙළෙඳ සැල" නමින් ලියාපදිංචි කිරීමට අදහස් කරයි. මේ සඳහා ලියාපදිංචි සහතිකය නිකුත් කරනුයේ,

(i) පලාත් සභාව යි (ii) ප්‍රාදේශීය සභාව යි.
(iii) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යි. (iv) සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලය යි.

❖ ව්‍යපාර සංවිධාන කෙරෙහි බලපාන පණත් කිහිපයක් පහත වේ.

A - 2007 අංක 7 දරණ සමාගම් පණත B - 1890 හවුල් ආඥා පණත
C - 1972 අංක 05 දරණ සමුපකාර සමිති පණත D - 1840 වංචා වැළක්වීමේ පණත

11. මින් හවුල් ව්‍යාපාර කෙරෙහි බලපාන පණත් වනුයේ,

(i) A පමණි. (ii) B පමණි. (iii) A, B හා C පමණි. (iv) A, B හා D පමණි

12. ඒක පුද්ගල ව්‍යාපාර, හවුල් ව්‍යාපාර හා සමාගම් යන සංවිධාන වර්ග තුනටම පොදු ගුණාංග ඇතුළත් වනුයේ,

(i) අසීමිත වගකීම, අයිතිකරුවන් පාලනය කිරීම, පෞද්ගලික අංශයට අයත්වීම.
(ii) පෞද්ගලික අංශයට අයත්වීම, අයිතිකරුවන් පාලනය කිරීම, ලාභ අරමුණු කර ගැනීම
(iii) ලාභ අරමුණු කර ගැනීම, නෛතික පුද්ගලභාවයක් සහිත වීම, ගිණුම් තැබීම අනිවාර්ය නොවීම.
(iv) අයිතිකරුවන් පාලනය කිරීම, ලාභ අරමුණු කර ගැනීම, රාජ්‍ය පාලනයෙන් යුක්තවීම.

13. හවුල් ව්‍යාපාරයක සිටිය යුතු උපරිම සාමාජික සංඛ්‍යාව දක්වා ඇත්තේ,

(i) 2007 අංක 7 දරණ සමාගම් පණත. (ii) වංචා වැළක්වීමේ ආඥා පණත.
(iii) 1890 හවුල් ආඥා පණත. (iv) 1972 අංක 05 දරණ සමුපකාර සමිති පණත.

14. හවුල් ව්‍යාපාරයක් සම්බන්ධ නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(i) ලාභ අරමුණු කරගත් පොදු අංශයේ ව්‍යාපාරයකි.
(ii) 1890 හවුල් ආඥා පණත යටතේ ලියාපදිංචි කළ යුතුය.
(iii) අවම සාමාජිකයින් සංඛ්‍යාව 02ක් වන අතර උපරිමය 20 කි.
(iv) අඛණ්ඩ පැවැත්මක් ඇත, වගකීම සීමිතය, නෛතික පුද්ගලභාවයක් නැත.

15. රාජ්‍ය දෙපාර්තමේන්තු පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,

(i) විශේෂ පනතක් හෝ පොදු පනතක් යටතේ ආරම්භ කළහැකි විම.
(ii) ප්‍රජාතන්ත්‍රවාදි පාලනයක් පැවතීම.
(iii) නීතිමය කටයුතු වලදි දෙපාර්තමේන්තු ප්‍රධානියා සිය නිලනාමයෙන් පෙනී සිටිය යුතුය.
(iv) දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අභිමතය පරිදි පාලන කටයුතු කලහැකි විම.

16. අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වන මුළුමනින්ම රජයේ සෘජු පාලනයට අයත්වන ආයතන,

(i) රාජ්‍ය සංස්ථා (ii) සමූපකාර සමිති

(iii) රාජ්‍ය දෙපාර්තමේන්තු (iv) රාජ්‍ය සමාගම්

17. පහත දක්වා ඇති ගනුදෙනු අතරින් වත්කම්, වගකීම් හා හිමිකම් යන සියල්ලම වෙනස්වන ගනුදෙනුව තෝරන්න.

(i) සමන්ගෙන් රු. 5,000ක තොගයක් ණයට ගැනීම.

(ii) ණයහිමි අමල්ට රු. 3,000ක් මුදලින් ගෙවීම.

(iii) බැංකු ණය සඳහා රු. 1,000 ක පොළිය ද සමග වාරිකය ගෙවීම.

(iv) රු. 1,000ක විදුලි බිල ගෙවීම.

18. පහත x තීරුවේ ලේජර් ගිණුම් ද y තීරුවේ ගිණුම් වර්ග ද දක්වා ඇත.

| X තීරුව | Y තීරුව |
| --- | --- |
| දුන් වට්ටම් | A - වගකීම් ගිණුම |
| විකුණුම් ගිණුම | B - ආදායම් ගිණුම |
| ගැනිලි ගිණුම | C - වියදම් ගිණුම |
| ණයහිමි ගිණුම | D - හිමිකම් ගිණුම |

X තීරුවේ දැක්වෙන ලෙජර් ගිණුම් ද Y තීරුවේ දැක්වෙන ගිණුම් වර්ගය සමග ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

(i) CDAB (ii) CBDA (iii) BDCA (iv) DBAC

19. ව්‍යාපාරයට රු. 10,000ක පොළී ආදායමක් ලැබී ඇත. මෙම ගනුදෙනුව සටහන් කළ යුතු ගිණුම් වර්ග වන්නේ,

(i) වත්කම් හා ආදායම් (ii) වත්කම් හා හිමිකම්

(iii) ආදායම් හා හිමිකම් (iv) වත්කම් හා වියදම්

20. ව්‍යාපාරයක් රු. 25,000 ක බඩුතොගයක් ණයට විකුණූ අතර අයිතිකරු රු. 4,000 භාණ්ඩ තොගයක් පෞද්ගලික ප්‍රයෝජනයට ගෙන යන ලදී. මෙහි පළමු ගනුදෙනුවේ මුලාශ්‍ර ලේඛණය .....01.... වන අතර දෙවන ගනුදෙනුව සටහන් කරන මූලික පොත .....02....... වේ.

(i) ලදුපත, මුදල් පොත (ii) ගැණුම් ඉන්වොයසිය, මුදල් පොත

(iii) විකුණුම් ඉන්වොයිසිය, පොදු ජ'නලය (iv) ලදුපත, පොදු ජ'නලය

21. පහත දැක්වෙන්නේ ලෙජරයේ ඇති ගිණුම් වර්ග කිහිපයකි.

A - ලැබූ වට්ටම් ගිණුම B - ගෙනයාමේ කුලි ගිණුම

C - ගැනිලි ගිණුම D - උපකරණ ගිණුම

මින් වැඩිවීම හර, අඩුවීම බැර යන ද්විත්ව සටහන් මූලධර්මය නිරූපනය වන ගිණුම් වර්ගය වන්නේ,

(i) A හා B (ii) B හා D (iii) A හා C (iv) B, C හා D

22. භාග්‍යාගේ ව්‍යාපාරයේ මූලික සටහන් පොත් කීපයක් A තීරුවේ ද ගනුදෙනු කීහිපයක් B තීරුවේ ද දැක්වේ.

| A තීරුව | B තීරුව |
| --- | --- |
| 1. මුදල් පොත | A විකුණුම් වලින් ලද රු. 20,000 චෙක් හා බැංකුවේ තැන්පත් කිරීම |
| 2. ගැණුම් ජනලය | B ව්‍යාපාරික කටයුත්තක් සඳහා ත්‍රීවිලර් කුලිය රු. 150ක් ගෙවීම. |
| 3. සුළු මුදල් පොත | C ණයගැතියකුගෙන් රු. 5,000 ක මුදලක් ලැබීම හා වට්ටම් ලෙස රු. 500ක් ලබා දීම. |
| 4. බැංකු ගිණුම | D විකිණීම සඳහා රු. 15,000 ක භාණ්ඩ ණයට ගැනීම |

A තීරුවේ පිළිවෙලට B තීරුව ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර වන්නේ,

(i) C, A, D, B (ii) A, D, C, B (iii) A, D, C, B (iv) C, D, B, A

23. පහත සඳහන් ලෙජර් ගිණුම් අතරින් බැර ශේෂයක් දක්නට නොලැබෙන ගිණුම වන්නේ,
(i) බැංකු ගිණුම (ii) මුදල් පොත (iii) ණයහිමි ගිණුම (iv) ලද පොලී ගිණුම

24. මෝටර් රථ අලෙවිකරණ ව්‍යාපාරයක මෝටර් රථ ණයට විකුණුම් සටහන් කරන මුලික පොත වන්නේ,
(i) පොදු ජ්නලයේ ය. (ii) ගැණුම් ජ්නලයේ ය. (iii) මුදල් පොතේ ය. (iv) විකුණුම් ජ්නලයේ ය.

25. අයිතිකරු තම පෞද්ගලික මුදලින් ණයහිමියන්ට රු. 10,000ක් ගෙවීම මෙම ගනුදෙනුවේ බලපෑම නිවැරදිව ගිණුම්කරණ සමීකරණය තුල දක්වා ඇති පිළිතුර වන්නේ,

| | **වත්කම්** | = | **අයිතිකරුගේ හිමිකම** | + | **වගකීම්** |
|---|---|---|---|---|---|
| (i) | - 10,000 | = | | | - 10,000 |
| (ii) | - 10,000 | = | - 10,000 | | |
| (iii) | | = | +10,000 | | +10,000 |
| (iv) | | = | +10,000 | | - 10,000 |

26. ව්‍යාපාරයක ආරම්භක දිනට ගිණුම්කරණ සමීකරණය පහත පරිදි වේ.

| වත්කම් | = | හිමිකම | + | වගකීම් |
|---|---|---|---|---|
| රු. 200,000 | | රු. 150,000 | | රු. 50,000 |

පසුව අයිතිකරු රු. 50,000ක ලී බඩු ව්‍යාපාරයට යෙදවීය. ඉන් පසු ගිණුම්කරණ සමීකරණය වන්නේ,
(i) වත්කම් රු. 200,000 = හිමිකම් රු. 150,000 + වගකීම් රු. 50,000
(ii) වත්කම් රු. 250,000 = හිමිකම් රු. 200,000 + වගකීම් රු. 50,000
(iii) වත්කම් රු. 250,000 = හිමිකම් රු. 150,000 + වගකීම් රු. 50,000
(iv) වත්කම් රු.150,000 = හිමිකම් රු. 150,000 + වගකීම් රු. 50,000

27. අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු. 2,000ක භාණ්ඩ රැගෙන යාම, මෙම ගනුදෙනුව සටහන් කිරීමට අදාල මුලාශ්‍ර ලේඛණය හා මූලික සටහන් පොත පිළිවෙලින් දැක්වෙන්නේ,
(i) ගෙවීම් වවුචරය, මුදල් පොත (ii) ගෙවීම් වවුචරය, පොදු ජ්නලය
(iii) ජ්නල් වවුචරය, පොදු ජ්නලය (iv) ජ්නල් වවුචරය, මුදල් පොත

28. ගනුදෙනුවක් සටහන් කිරීමට අදාල ද්විත්ව සටහන පහත දැක්වේ.
ණයගැති ගිණුම හර රු. 8,000
විකුණුම් ගිණුම බැර රු. 8,000

මෙම ගනුදෙනුව වන්නේ,
(i) රු. 8,000 ක් භාණ්ඩ ණයට විකිණීම (ii) රු. 8,000 ක් භාණ්ඩ ණයට ගැනීම
(iii) රු. 8,000 ක් භාණ්ඩ අත්පිට විකිණීම (iv) රු. 8,000 ක් භාණ්ඩ අත්පිට මිලදී ගැනීම.

29. පහත ප්‍රකාශ අතරින් නිවැරදි නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(i) වෙළෙඳ වට්ටම් ගිණුම් ගත කරයි.
(ii) මුදල් වට්ටම් ගිණුම්ගත කරයි.
(iii) වෙළෙඳ වට්ටම්, ලද වට්ටම් පමණක් ගිණුම් ගත කරයි.
(iv) මුදල් වට්ටම් ගිණුම්ගත නොකරයි.

30. මාධවීගේ ව්‍යාපාරයේ ණයහිමියකු වු නිමල් ට රු. 20,000ක ණය පියවීමේ දී 5% වට්ටමක් හිමි විය. මෙය මාධවීගේ ව්‍යාපාරයේ,
(i) රු. 1,000 ක දුන් වට්ටම කි. (ii) රු. 1,000 ක ලද වට්ටමකි
(iii) රු. 2,000 ක දුන් වට්ටම කි. (iv) රු. 2,000ක ලද වට්ටමකි.

31. ලද චෙක්පතක් බැංකු ගිණුමේ තැන්පත් කිරීමට අදාල නිවැරදි ද්විත්ව සටහන තෝරන්න.
(i) බැංකු ගිණුම හර
මුදල් පොත බැර
(ii) මුදල් පොත හර
බැංකු ගිණුම බැර
(iii) බැංකු ගිණුම හර
ප්‍රාග්ධන ගිණුම බැර
(iv) ප්‍රාග්ධන ගිණුම හර
බැංකු ගිණුම බැර

32. තැන්පත් කළ චෙක්පතක් අගරු වූ විට ව්‍යාපාරය තැබිය යුතු ද්විත්ව සටහන වන්නේ,

(i) ණය ගැති ගිණුම හර
බැංකු ගිණුම බැර

(ii) ණයහිමි ගිණුම හර
බැංකු ගිණුම බැර

(iii) බැංකු ගිණුම හර
ණයගැති ගිණුම බැර

(iv) මුදල් ගිණුම හර
බැංකු ගිණුම බැර

33. කල්පනිගේ ව්‍යාපාරය රු. 60,000 බඩුතොගයක් රශ්මිගෙන් ණයට ගත් අතර කල්පනී මෙම ණය මුදල පියවීමේ දී රශ්මිගෙන් 4% වට්ටමක් හිමිවිය. මෙම ගනුදෙනුවට අදාල නිවැරදි පිළිතුර වන්නේ,

(i) කල්පනිගේ ව්‍යාපාරයේ දුන් වට්ටම රු. 2,400 වැඩිවේ.
(ii) කල්පනීගේ ව්‍යාපරයේ ලද වට්ටම රු. 2,400 වැඩිවේ.
(iii) වට්ටම 2,400 පොත්වල සටහන් නොකරයි.
(iv) රශ්මිගේ ව්‍යාපාරයේ ලැබූ වට්ටම රු. 2,400 වැඩි වේ.

34. කවීෂාගේ ව්‍යාපාරයේ බැංකු ගිණුම 2023.02.28 දිනට රු. 31,000ක හර ශේෂයක් පෙන් වූ නමුදු බැංකු ප්‍රකාශයට අනුව ගිණුමේ ශේෂය රු. 38,000 කි. ඉහත වෙනසට බලපෑ හැකි හේතුව,

(i) බැංකු ගාස්තු රු. 7,000 ක් ගෙවීම යි.
(ii) ස්ථාවර නියෝග මග රු. 7,000ක රක්ෂණ වාරිකය ගෙවීම යි.
(iii) ණයගැති ප්‍රේෂණ රු. 7,000ක් ලැබීම යි.
(iv) බැංකු ණය වාරිකය ලෙස රු. 7,000ක් අය කර ගැනීම යි.

❖ පහත තොරතුරු ඇසුරෙන් ප්‍රශ්ණ 35, 36 ට පිළිතුරු සපයන්න.
2022 පෙබරවාරි 28 දිනට බැංකු ගිණුමේ ශේෂය රු. 15,200ක් විය. පහත හේතු නිසා බැංකු ශේෂයේ ඊට වඩා වෙනස් විය.

A නිකුත් කළමුත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 5,000 කි.
B බැංකුවට සෘජුවම ලැබී ඇති ණයගැති ප්‍රේෂණ රු. 1,500 කි.
C බැංකුව අයකර ඇති බැංකු ගාස්තු රු. 500 කි.

35. ඉහත හේතු අතරින් බැංකු ගිණුමේ ශේෂය රු. 15,200 ක් විය. පහත හේතු නිසා බැංකු ප්‍රකාශයේ ශේෂය ඊට වඩා වෙනස් විය.

(i) B හා C (ii) A හා B (iii) A හා C (iv) A, B හා C

36. 2022 පෙබරවාරි 28 දිනට සංශෝධිත බැංකු ශේෂය,

(i) රු. 14,200 (ii) රු. 19,700 (iii) රු. 16,200 (iv) රු. 21,200

37. ව්‍යාපාරයක සුළු මුදල් භාරකරු සන්තකයේ 2023.01.01 දින රු. 250ක් ඉතිරිව තිබුණි. ප්‍රධාන මුදල් භාරකරු එදින රු. 4,750 ක් දී එය ප්‍රතිපූරණය කරන ලදි. මාසය අවසානයේ සුළු මුදල් භාරකරු ලග රු. 850ක් ඉතිරිව තිබුණි. ඊළග මාසයේ දී ප්‍රධාන මුදල් භාරකරු විසින් ප්‍රතිපූර්ණය කළ යුතු මුදල වන්නේ,

(i) රු. 4,750 (ii) රු. 4,150 (iii) රු. 850 (iv) රු. 250

38. පහත ගනුදෙනු අතරින් ගැණුම් ජ'නලයේ සටහන් කරනුයේ,

(i) රු. 5,000ක ලියන මේසයක් ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා ණයට ලබා ගැනිම
(ii) රු. 12,000ක භාණ්ඩ නැවත විකිණීමට ණයට ලබා ගැනීම
(iii) රු. 12,000ක භාණ්ඩ නැවත විකිණීමට මුදලට ලබා ගැනීම
(iv) රු. 5,000ක ලියන මේසයක් ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා අත්පිට මිලදී ගැනීම.

39. ව්‍යාපාරයක සිදු වි ඇති ගනුදෙනු වලින් පොදු ජ'නලයේ වාර්තා කලයුතු ගනුදෙනුව කුමක් ද ?

(i) ව්‍යපාරයේ ප්‍රයෝජනය සඳහා රු. 25,000 ගෙවා ලබා ගත් මෝටර් රථය.

(ii) මෝටර් රථය රු. 5,000 ක්ෂය වීම.

(iii) ණයගැතියන්ගෙන් මුදල් ලැබිමේ දී දුන් වට්ටම රු. 400

(iv) ගෙවිය යුතුව තිබු විදුලිබිල රු. 700 ගෙවිම.

40. ශේෂ පිරික්සුම පිළියෙල කරනු ලබන්නේ යම් කාල පරිච්ඡේදයක් අවසනායේ දී,

(i) අත ඉතිරි මුදල් ශේෂය සෙවීම සඳහා ය.

(ii) ගනුදෙනුවල ගණිතමය නිවැරදිතාවය තහවුරු කර ගැනීම සඳහා.

(iii) ලෙජර් ගිණුම් නිවැරදිව තුලනය කර ඇති බව දැන ගැනිම සඳහා

(iv) මුල්‍ය තත්වය සෙවීම සඳහා ය.

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක
සිසිර කුමාර
විසින් සම්පාදිත යි.